# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 නොවැම්බර් මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 14.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 7.50 යි.

## 2009 අංක 66 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 8/2007.

### 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2009 අංක 66 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1992 අංක 33 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1992 අංක 33 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "පහත සඳහන් සාමාජිකයන් පස්දෙනාගෙන් සමන්විත විය යුතු ය" යන වචන වෙනුවට "පහත සඳහන් සාමාජිකයන් හත්දෙනාගෙන් සමන්විත විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) (i) කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(ii) පරිසර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයකු ;

(iii) භූවිද්‍යා, පතල්, ව්‍යාපාර කළමනාකරණය, මුදල් සහ නීතිය යන ක්ෂේත්‍රවල ප්‍රායෝගික පළපුරුද්ද සහ දැනුම ඔප්පු කර ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන්නා වූ සාමාජිකයන් තිදෙනකු,

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "තිදෙනෙකු විය යුතු ය" යන වචන වෙනුවට "පස්දෙනකු විය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) භූවිද්‍යාඥයකු හෝ පතල් ඉංජිනේරුවරයකු වශයෙන් යටත් පිරිසෙයින් වසර දොළහක ඔප්පු කරන ලද වෘත්තීය සහ ව්‍යවහාරික පළපුරුද්ද සමග ඒ පිළිබඳව පශ්චාත් උපාධියක් හෝ අධිකාර පත්‍රයක් දරනු ලබන තැනැත්තකු පතල් හා භූ විද්‍යා සමීක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා පත් කරනු ලැබිය යුතු ය."

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "(මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන" යන වචනවල සිට "විය යුතු අතර" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට "(මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් අධ්‍යක්ෂ ජනරාල්වරයා, කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන තාක්ෂණ නිලධරයා විය යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "අවුරුදු හයක කාලයක් සඳහා" යන වචන වෙනුවට "අවුරුදු තුනක කාලයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මේ උපවගන්තියෙන් පවරා ඇති බලතල හැර, මේ පනතින් කාර්යාංශය වෙත සතු කර ඇති හෝ පනවා ඇති හෝ පවරා ඇති සියලු හෝ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය

මණ්ඩලය විසින්, නමින් හෝ ධුරයෙන් කාර්යාංශයේ සභාපතිවරයා, අධ්‍යක්ෂ ජනරාල්වරයා, කාර්යාංශයේ සේවා නියුක්තිකයකු හෝ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයකු වන්නා වූ යම් තැනැත්තකු වෙත පවරනු ලැබිය හැකි ය.''

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ඇ) ඡේදයේ "ඒ ඛණිජ සකස් කිරීම, වෙළෙඳාම" යන වචන වෙනුවට "ඒ ඛණිජ සකස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, වෙළෙඳාම" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (ඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඉ) ඛණිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම මගින් ඒවා ප්‍රවර්ධනය කිරීම, නිශ්කර්ෂණය කිරීම, වටිනාකම් එකතු කිරීම සඳහා සහ වාණිජමය පදනමක් මත එකී ඛණිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ඊ) පනතේ විශේෂයෙන් ම මේ වගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේද යටතේ වූ කර්තව්‍ය ඉටු කිරීමේ දී ලබාගත් තොරතුරු සහ දත්ත උචිත මාධ්‍ය මගින් පතල කිරීම ; සහ

(උ) ඉංජිනේරු භූ විද්‍යාව හා සම්බන්ධ ව්‍යාපෘති භාරගැනීම සහ භූ විද්‍යාත්මක ආපදා සහ ව්‍යසන සම්බන්ධයෙන් ප්‍රතිකර්ම වශයෙන් ගත යුතු පියවර පිළිබඳව උපදෙස් ලබාදීම.''

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) (i) ඉල්ලුම්පත ලැබීමෙන් පසු හෝ ප්‍රචාරණය කිරීමෙන් සහ අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා කැඳවීමෙන් පසු ගවේෂණ කටයුතු සිදු කිරීම සඳහා ;

(ii) කැනීම් කටයුතු ;

(iii) ප්‍රවාහනය කිරීම ;

(iv) වෙළෙඳාම් කිරීම ;

(v) ගබඩා කිරීම ; සහ

(vi) ඛණිජ ද්‍රව්‍ය අපනයනය කිරීම,

පිණිස බලපත්‍ර නිකුත් කිරීමේ ;

(2) එම උපවගන්තියේ (උ) ඡේදයේ "සියලු දේ කිරීමේ" යන වචන වෙනුවට "සියලු දේ කිරීමේ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඌ) යම් භූ විද්‍යා හෝ පතල් ව්‍යාපෘතියක් පිළිබඳ යෝජනාවක් සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කිරීමේ දී අවස්ථාවෝචිත පරිදි යම් අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තුවක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක යම් තාක්ෂණික ඇගයීම් කමිටුවක සාමාජිකයකු වශයෙන් සේවය කිරීමේ."

ප්‍රධාන ප්‍රඥප්තියට 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එකී ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

"කාර්යාංශය බදු ගාස්තු යනාදිය ගෙවීමෙන් නිදහස් බව.

20අ. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අවස්ථාවෝචිත පරිදි බදු, ගාස්තු හෝ අයභාරයක් පැනවීම පාලනය කරනු ලබන 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත ප්‍රකාරව හෝ තත්කාලයේ බලපවත්නා වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව අවසර දී ඇති තාක් දුරට වූ බදු, ගාස්තු හෝ වෙනත් යම් අයභාරයක් කාර්යාංශයේ යම් ලාභ සහ ආදායම මත ගෙවීමෙන් කාර්යාංශය නිදහස් කරනු ලැබිය යුතු ය.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 27 වන වගන්තියෙහි "සහ 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතෙහි විධිවිධාන අදාළ වන ඛණිජ ද්‍රව්‍ය කිසිවක් කෙරෙහි මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය". යන වචන වෙනුවට "සහ 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතෙහි විධිවිධාන අදාළ වන ඛණිජ ද්‍රව්‍ය කිසිවක් කෙරෙහි මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු ය :

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

එසේ වුව ද, පනතේ 12 වන වගන්තියේ (ආ) ඡේදයේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයේ සිදු කෙරෙන හයිඩ්‍රෝකාබන් සහ මැණික් සෙවීම හා සම්බන්ධ සියලු සමීක්ෂණ සහ විමර්ශන පිළිබඳ දත්ත සහ වාර්තා කාර්යාංශය වෙත ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියෙහි (1) වන උපවගන්තියේ "කිසිම තැනැත්තකු විසින් ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැණීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළෙඳාම් කිරීම හෝ" යන වචන වෙනුවට "කිසිම තැනැත්තකු විසින් ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැණීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, වෙළෙඳාම් කිරීම හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියෙහි "පැවරිය හැකි ය" යන වචන වෙනුවට "පැවරිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (4) වන උපවගන්තියේ "ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ඛණිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා" යන වචන වෙනුවට "තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන ඛණිජ ද්‍රව්‍ය කිසිවක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැණීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළෙඳාම් කිරීම" යන වචන වෙනුවට "ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැණීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, වෙළෙඳාම් කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) (අ) ඡේදයේ (IV) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන් :—

"(v) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු ;"

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (අ) ඡේදය ඉවත් කිරීම මගින් ;

(2) එම වගන්තියේ (ඇ) ඡේදයේ "ජලාශයක, ඇළක, වැවක" යන වචන වෙනුවට "ජලාශයක, ගඟක, ඇළක හෝ වැවක" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (ඌ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

"(ඌ) අමාත්‍යවරයාගේ සහ වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ අර්ථානුකූලව වෙරළබඩ කලාපය ලෙස ගැනෙන ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් මත ;

(එ) මහවැලි සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කර ඇති විශේෂ බිම් ප්‍රදේශයක් ලෙස ගැනෙන ප්‍රදේශයක් තුළ පිහිටා ඇති යම් ඉඩමක් මත ;

(ඒ) වනජීවී විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව (451 වන අධිකාරය වූ) කැලෑ ආඥාපනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති හෝ පිහිටුවා ඇති යම් රක්ෂිත වනාන්තරයක හෝ ග්‍රාමීය වනාන්තරයක් ලෙස ගැනෙන ප්‍රදේශයක පිහිටා ඇති යම් ඉඩමක් මත ;

(ඔ) නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වන වගන්තිය යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයකට පත් කර ඇති ප්‍රදේශයක් ඇතුළත පිහිටි යම් ඉඩමක් මත ;

(ඕ) වනජීවී සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව (469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ ප්‍රකාශයට පත්කර ඇත්තා වූ යම් ජාතික රක්ෂිතයක් හෝ අභය භූමියක් තුළ පිහිටි යම් ඉඩමක් මත.”.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (අ) ඡේදයේ “ඉඩමක් මත ; සහ” යන වචන වෙනුවට “ඉඩමක් මත;” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (ආ) ඡේදයේ “ඉඩමක් මත” යන වචන වෙනුවට “ඉඩමක් මත ;” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

“(ඇ) (446 වන අධිකාරය වූ) උද්භිද උද්‍යාන ආඥාපනතේ අර්ථානුකූලව උද්භිද උද්‍යානයක් ඇතුළත පිහිටා ඇති යම් ඉඩමක් මත හෝ එකී ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් ප්‍රදේශයක් මත පිහිටි ඉඩමක් මත ;

(ඈ) 1988 අංක 3 දරන ජාතික උරුම වනජීවී ප්‍රදේශ පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද යම් ජාතික උරුම වනජීවී ප්‍රදේශයක් ; සහ

(ඉ) (231 වන අධිකාරය වූ) සුසාන භූමි සහ භූමදාන උද්‍යාන ආඥා පනතේ අර්ථානුකූලව යම් භූමදාන උද්‍යානයක් හෝ සුසාන භූමියක් ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යුරේනියම්," යන වචනයේ සිට "අපනයනය කිරීම සඳහා" යන වචන දක්වා වූ වචන ඉවත් කර, ඒ වෙනුවට "විකිරණශීලී මූලද්‍රව්‍ය අන්තර්ගත යම් ඛණිජ ද්‍රව්‍ය සහ හිරිගල් ගවේෂණය කිරීම හෝ කැණීම, ඒවා ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) (ආ) ඡේදයේ "ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම, පතල් කැණීම, ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම පිණිස" යන වචන වෙනුවට "ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම හෝ පතල් කැණීම, ප්‍රවාහනය කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම පිණිස" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඇ) ඡේදයේ "ගවේෂණය කිරීමට, පතල් කැණීමට, ප්‍රවාහනය කිරීමට, සකස් කිරීමට, වෙළෙඳාම් කිරීමට හෝ අපනයනය කිරීමට අවසර දී ඇත්තේ" යන වචන වෙනුවට "ගවේෂණය කිරීම සඳහා, පතල් කැණීම සඳහා, ප්‍රවාහනය සඳහා, සකස් කිරීම සඳහා, ගබඩා කිරීම සඳහා වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම සඳහා අවසර දී ඇත්තේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) අතුරු විධානය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :—

"එසේ වුව ද, "ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය කිරීම" පිණිස වූ යම් කාර්මික කැණීම් බලපත්‍රයක් හෝ ගවේෂණ බලපත්‍රයක් එකී බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව පැවරීම හෝ ඇපයක් වශයෙන් ලබාදීම කරනු ලැබිය හැකි ය.".

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ—

(අ) (අ) ඡේදයේ "ගවේෂණය කිරීම, පතල් කැණීම, ඒවා සකස් කිරීම, වෙළෙඳාම් කිරීම" යන වචන වෙනුවට "ගවේෂණය කිරීම, පතල් කැණීම, ප්‍රවාහනය, ඒවා සකස් කිරීම, ගබඩා කිරීම, වෙළෙඳාම් කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඉ) ඡේදයේ "මාස හයක් නොඉක්මවන කාලයක්" යන වචන වෙනුවට "මාස තුනක් ඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන්.".

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "මාස හයකට වැඩි කාලයක්" යන වචන වෙනුවට "මාස තුනකට වැඩි කාලයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ "තමාගේ පෞද්ගලික ප්‍රයෝජනය පිණිස" යන වචන වෙනුවට "වාණිජ අරමුණක් නොවන්නා වූ තමාගේ පෞද්ගලික ප්‍රයෝජනය පිණිස" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් ඉඩමක්, පතලක් හෝ වෙනත් යම් පරිශ්‍රයක් වෙනුවෙන් ද ඒ ඉඩමට, පතලට හෝ වෙනත් යම් පරිශ්‍රයකට ඇතුල් වී පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රයේ නියම හා කොන්දේසි හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ

යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ අනුව ක්‍රියා කර තිබේ ද, යන්න නිසැකව දැනගැනීම පිණිස අවශ්‍ය විය හැකි—

(i) යම් විමර්ශන හෝ සමීක්ෂණ ඒ ඉඩමෙහි, පතලෙහි හෝ ඒ පරිශ්‍රයේ දී කරගෙන යාමේ ; හෝ

(ii) එහි දී සොයා ගන්නා ලද පිරියත, උපකරණ, යන්ත්‍ර සූත්‍ර, ගිණුම් පොත් සැලැස්මවල් හෝ වෙනත් ලේඛන සම්බන්ධයෙන් විමර්ශන සහ විභාග පැවැත්වීමේ ;”

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ පැති සටහන වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

“භූ විද්‍යා සහ ඛණිජ ද්‍රව්‍ය පිළිබඳ විමර්ශන පැවැත්වීමට නිලධරයන් ආදීන් හට බලය ඇති බව”

ප්‍රධාන ප්‍රඥප්තියට 46අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 46අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

“බලය දෙනු ලැබූ නිලධරයන්ට ඇතුල්වීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම ආදිය සඳහා බලය ඇති බව.

46අ. කාර්යාංශයේ කාර්යය ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි බවට කාර්යාංශය තීරණය කරනු ලබන සහ (මෙහි මින් මතු “බලය ලත් නිලධරයා” යනුවෙන් සඳහන් කරනු ලබන) ලිඛිතව බලය දෙනු ලබන කාර්යාංශයේ යම් නිලධරයකු විසින්—

(අ) මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරන්නේ ද යන්න විමසීමේ කාර්යය සඳහා මේ පනත යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක අධිකාරය යටතේ යම් ඛණිජ ද්‍රව්‍ය, පතල් කැණීම්, ඒවා ගවේෂණය කිරීම, සකස් කිරීම, ගබඩා කිරීම, වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම සිදු කරනු ලබන යම් වැඩ බිමක්, පරිශ්‍රයක් හෝ ස්ථානයක් වෙත ඇතුල්වීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම ;

(ආ) මේ පනත යටතේ වූ යම් බලපත්‍රයක අධිකාරය නොමැතිව යම් ඛණිජ ද්‍රව්‍යයක් සඳහා පතල් කැණීම, ගවේෂණය කිරීම, ඒවා සකස් කිරීම, ගබඩා කිරීම, වෙළෙඳාම් කිරීම හෝ අපනයනය කිරීම සිදු කරනු ලබන බවට විශ්වාස කිරීම සඳහා ඒ නිලධරයා වෙත සාධාරණ හේතු ඇති අවස්ථාවක යම් වැඩ බිමක්, පරිශ්‍රයක් හෝ ස්ථානයක් වෙත ඇතුල්වීම, සෝදිසි කිරීම සහ පරීක්ෂා කිරීම ;

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ සාදන ලද යම් නියෝග උල්ලංඝනය කරමින් අවස්ථාවෝචිත පරිදි ඛණිජ ද්‍රව්‍ය ප්‍රවාහනය කරනු ලබන හෝ අපනයනය කරනු ලබන බවට විශ්වාස කිරීම සඳහා ඒ නිලධරයා වෙත සාධාරණ හේතු ඇති අවස්ථාවක යම් වාහනයක් හෝ යාත්‍රාවක් නැවැත්වීම, එයට ගොඩවීම සහ පරීක්ෂා කිරීම,

කරනු ලැබිය හැකි ය.”.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ අවසානයට පහත දැක්වෙන උපවගන්ති එකතු කිරීම මගින් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(3) ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය කිරීම සඳහා නිකුත් කරන ලද යම් බලපත්‍රයක් දරන්නා විසින් එකී බලපත්‍රය නිකුත් කර ඇත්තේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් ද එම ප්‍රදේශයේ වාණිජ පදනමක් මත ඛණිජ ද්‍රව්‍ය දියුණු කිරීම සහ කැණීම සඳහා තීරණය කරනු ලබන අවස්ථාවක දී ඔහු විසින් ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය සඳහා වූ බලපත්‍රයට සම්බන්ධිත කොන්දේසිවලට එකඟව ක්‍රියා කර ඇත්නම් සහ ඛණිජ ද්‍රව්‍ය කැණීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙම පනතේ වෙනත් යම්

විධිවිධානයක් යටතේ අන්‍යාකාරයකින් නුසුදුසු නොවන්නේ නම්, එකී ප්‍රදේශය සම්බන්ධයෙන් කාර්මික කැණීම් බලපත්‍රයක් හෝ ශිල්පීය කැණීම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ඔහුට අනන්‍ය අයිතියක් තිබිය යුතු ය.

(4) ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය කිරීම සඳහා බලපත්‍රයක් දරනු ලබන තැනැත්තා විසින් ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය කිරීම සඳහා ඉල්ලීමක් කිරීමේ දී, ලේකම්වරයා විසින් අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය සහිතව එකී බලපත්‍රලාභියා සමග ආයෝජන ගිවිසුමකට එළඹිය යුතු ය. එවැනි සෑම ආයෝජන ගිවිසුමක් ම නියම කරනු ලබන ආකෘතියෙන් විය යුතු අතර, නියම කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි එම ගිවිසුමට අන්තර්ගත විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ “සියලු ඛණිජ ද්‍රව්‍ය සඳහා පතල් කැණීම සහ ඒ ඛණිජ ද්‍රව්‍ය වෙළඳාම් කිරීම හා අපනයනය කිරීම සඳහා” යන වචන වෙනුවට “එකී බලපත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති ඛණිජ ද්‍රව්‍ය පමණක් කැණීම සඳහා සහ නිෂ්පාදන ප්‍රවර්ධනයෙන් පසුව හැකි අවස්ථාවල දී එකී ඛණිජ ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීම සහ අපනයනය කිරීම සඳහා” යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ “එසේ වුව ද” යන වචනවල සිට “ක්‍රියාවේ නොයෙදිය යුතු ය” යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට “එසේ වුව ද, ඉඩමේ එවැනි යම් ප්‍රදේශයක සන්තකය අයිතිකරු විසින් හෝ රාජ්‍ය සංවිධානය විසින් දරනු ලබන අවස්ථාවක දී, එම අයිතිකරුගේ හෝ රාජ්‍ය සංවිධානයේ කැමැත්ත ඇතිව මිස, මේ වගන්තිය මගින් තමා වෙත පවරා ඇති අයිතිවාසිකම් බලපත්‍රය දරන්නා විසින් ක්‍රියාවේ නොයෙදිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසේ ශීර්ෂය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ (III) වන කොටසේ ශීර්ෂයේ “පතල්වල කම්කරුවන්ගේ සෞඛ්‍ය ; ආරක්ෂාව සහ සුභසාධනය” යන වචන වෙනුවට “ඛණිජ ද්‍රව්‍ය කැණීම් කටයුතුවල යෙදී සිටින කම්කරුවන්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුභසාධනය” යන වචන ආදේශ කිරීමෙන් එම ශීර්ෂය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (අ) කළමනාකරණ තත්ත්වයේ යෙදී සිටින යම් ස්ත්‍රියකට ;

(ආ) සෞඛ්‍ය හෝ සුභසාධන සේවා සපයමින් සිටින යම් ස්ත්‍රියකට ; හෝ

(ඇ) යම් පාඨමාලාවක කොටසක් වශයෙන් භූගත කැණීම් කටයුතු පිළිබඳ දැනුවත් වී සිටීමට නියම කරනු ලැබ ඇති යම් ස්ත්‍රියක් සඳහා,

(1) වන උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.".

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) එකී කාර්යය සඳහා බඳවා ගැනීම තත්කාලයේ බලපවත්නා කම්කරු නීති සහ නියෝග ප්‍රකාරව විය යුතු ය.".

**28.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "වැඩ කරන ලෙස" යන වචන වෙනුවට "වැඩ කරන ලෙස හදිසි අනතුරක දී හැර" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29.** ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියෙන්" යන වචන වෙනුවට "(2) වන උපවගන්ති මගින්" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 61 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "පතල් කණින හෝ ඒවා සකස් කරන, ප්‍රවාහනය කරන, වෙළෙඳාම් කරන හෝ අපනයනය කරන" යන වචන වෙනුවට "පතල් කණින හෝ ඒවා සකස් කරන, ගබඩා කරන, ප්‍රවාහනය කරන, වෙළෙඳාම් කරන හෝ අපනයනය කරන" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ "මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්ලක්ෂයක් නොඉක්මවන" යන වචනවල සිට "බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පනස් දහසකට අඩු නොවන සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට සහ දෙවන හෝ තදනන්තර වරදක් සම්බන්ධයෙන් වන විට දී රුපියල් එක් ලක්ෂ පනස් දහසකට අඩු නොවන සහ රුපියල් මිලියන දෙකක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් (1අ) සහ (1ආ) උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(1අ) මේ පනත යටතේ තත්කාර්යය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව යම් ඉඩමක් මත ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය කිරීම හෝ පතල් කැණීම සම්බන්ධයෙන් මේ පනත යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී, මහෙස්ත්‍රාත්වරයා විසින් එකී තැනැත්තාට පනවන ලද දඩය හෝ බන්ධනාගාරගත

කිරීමට අමතරව, එකී ගවේෂණ හෝ කැණීම් කටයුතුවලට පෙරාතුව එම ඉඩම තිබූ තත්ත්වයට ප්‍රතිෂ්ඨාපනය හෝ පුනරුත්ථාපනය කරන ලෙස ඒ තැනැත්තාට ආඥා කරනු ලැබිය හැකි ය.

(1ආ) (1අ) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කර ඇත්තේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද එම ඉඩම, ඛණිජ ද්‍රව්‍ය සඳහා ගවේෂණය හෝ කැණීම් කටයුතු ආරම්භ කිරීමට පෙර තිබුණු තත්ත්වයට පත්කර ඇති බවට ප්‍රකාශ කරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අත්සනින් වූ සහතික පත්‍රයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය විය යුතු අතර, එහි අන්තර්ගත කරුණු බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.”.

(4) එම වගන්තියේ (2) වන උපවගන්තියේ “මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි දී පවත්වනු ලබන” යන වචනවල සිට “මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ” යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට “මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන් දහසකට අඩු නොවන සහ රුපියල් හැත්තෑපන් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක කාලයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ” යන වචන ආදේශ කිරීමෙන් ;

(5) එම වගන්තියේ (3) වන උපවගන්තියේ “රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට” යන වචන වෙනුවට “රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට” යන වචන ආදේශ කිරීමෙන්.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 63අ, 63ආ, 63ඇ සහ 63ඈ වගන්ති ලෙස බලාත්මක වන්නේ ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 63අ, 63ආ, 63ඇ සහ 63ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

“තහනමට ගැනීමේ බලය. 63අ. (1) මේ පනත යටතේ යම් වරදක් සිදු වී ඇති බවට සාධාරණ හේතු පෙනී යන යම් පොලිස්

නිලධරයකු විසින් වරෙන්තුවක් ඇතිව හෝ නොමැතිව කණින ලද යම් ඛණිජ ද්‍රව්‍ය ප්‍රමාණයක් හෝ එම වරද සිදු කිරීමෙහි දී භාවිත කරන ලද යන්ත්‍ර, උපකරණ හෝ ද්‍රව්‍ය තහනමට ගනු ලැබිය හැකි ය.

(2) යම් පොලිස් නිලධරයකු විසින් මේ වගන්තිය මගින් තමා වෙත පවරා ඇති බලතල අනුව යම් ඛණිජ ද්‍රව්‍යයක්, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය තහනමට ගෙන ඇති අවස්ථාවක දී, ඔහු විසින් වහාම එකී ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය මහෙස්ත්‍රාත්වරයකුගේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් එම ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය සම්බන්ධයෙන් පනවන ලද නඩුවක් විභාග වීම අවසන් වන තුරු එම ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය රඳවා තබා ගැනීම හෝ අත්අඩංගුවට ගැනීම පිළිබඳව සුදුසු යයි තමාට හැඟී යන ආඥාවක් නිකුත් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එසේ තහනමට ගන්නා ලද ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය ශීඝ්‍රයෙන් විනාශ වී යැමකට යටත් වන්නේ නම්, එකී ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය විකිණිය යුතු බවටත්, එම විකිණීමෙන් උපචිත වන මුදල් අධිකරණයේ තැන්පත් කළ යුතු බවටත් මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

රාජසන්තක වීම.

63ආ. (1) මේ පනත යටතේ යම් වරදක් සඳහා යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී මහෙස්ත්‍රාත්වරයා විසින් එම වරද සිදු කිරීමේ දී ඒ සම්බන්ධයෙන් භාවිත කරන ලද ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය හෝ එම ඛණිජ ද්‍රව්‍ය හෝ ද්‍රව්‍ය විකිණීමෙන් උපචිතවන 63අ වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණයේ තැන්පත් කර ඇති මුදල් රාජසන්තක විය යුතු බවට ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රාජසන්තක කරන ලද යම් ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය එකී ආඥාව කිරීමෙන් පසුව රජයට පරම වශයෙන් සතුවිය යුතු ය.

(3) එවැනි සතු කිරීමක්—

(අ) අභියාචනයක් ඉදිරිපත් නොකරන අවස්ථාවක දී, රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති මහාධිකරණයක් වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාල සීමාව අවසන් වීමෙන් පසුව ; හෝ

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පිහිටුවා ඇති මහාධිකරණයක් වෙත හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී රාජසන්තක කිරීමේ ආඥාව තහවුරු කිරීම හෝ අභියාචනය ඉවත දැමීම පිළිබඳව එකී අභියාචන තීන්දුවෙන් පසුව,

බලාත්මක විය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ රජය වෙත සතු කරන ලද යම් ඛණිජ ද්‍රව්‍ය, යන්ත්‍රෝපකරණ, උපකරණ හෝ ද්‍රව්‍ය විකිණීමට සහ එම විකිණීමෙන් උපචිත වන මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට අධිකරණය විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

වරදවල් සංඥෙය වරදවල් ලෙස සලකනු ලැබිය යුතු බව.

63ඇ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මෙම පනත යටතේ වූ සෑම වරදක් ම එම පනතට අර්ථානුකූලව සහ එම පනතේ කාර්යය සඳහා සංඥෙය වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

කාර්යාංශයේ සෑම නිලධරයකු ම සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

63ඈ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත මගින් සාම නිලධරයන් වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කාර්යාංශයේ සෑම නිලධරයකුම ඒ පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) නියමිත යයි මේ පනතින් නියම කරනු ලැබූ හෝ මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නියෝග සෑදීමට විශේෂයෙන් පහත සඳහන් සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) පතල්වල සහ ඒ අවට සේවකයන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳව ;

(ආ) පතල්වල සනීපාරක්ෂක තත්ත්වයන් ;

(ඇ) පතල්වල දී සැපයිය යුතු වෛද්‍ය පහසුකම් ;

(ඈ) පතල් තුළ අපද්‍රව්‍ය, ඉවත ලන දෑ සහ විෂ සහිත ද්‍රව්‍ය කළමනාකරණය කිරීම ;

(ඉ) කැණීම් කටයුතු පිළිබඳ කළමනාකරුවන් පත් කිරීම ;

(ඊ) කැණීම් කටයුතුවල දී කම්කරුවන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ විමර්ශනය කිරීම සඳහා කමිටු පත් කිරීම ;

(උ) පතල්වල දී සිදුවන අනතුරු සහ මරණ පිළිබඳව වාර්තා කිරීම ;

(ඌ) පතල් හා සම්බන්ධ වාර්තා සහ ගිණුම් පවත්වාගෙන යාම ;

(එ) පතල් තුළ කැණීම් කටයුතුවල දී පුපුරන ද්‍රව්‍ය මෙහෙයවීම සහ භාවිත කිරීම ;

(ඒ) පතල්වල කැණීම් කටයුතු සඳහා යන්ත්‍රාගාර හෝ යන්ත්‍රෝපකරණ භාවිත කිරීම විධිමත් කිරීම ;

(ඔ) ඛණිජ ද්‍රව්‍ය ගබඩා කිරීම ;

(ඕ) රාජ්‍ය භාග නියම කිරීම සහ එකතු කිරීම ;

(ක) පරිසරය සහ පතල් ප්‍රතිෂ්ඨාපන කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සහ ඒවා ඉදිරිපත් කිරීම මෙන්ම ඒවාට අනුකූලව ක්‍රියා කිරීමේ ආකාරය.".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ "ගල්වලවල්, පතල් සහ ඛණිජ ද්‍රව්‍ය" යන වචන වෙනුවට "පතල්, ගල්වලවල් සහ ඛණිජ ද්‍රව්‍ය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ "පළාත් පාලන ආයතන" යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කරමින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

""පතල" යන්නෙන් ගවේෂණ කටයුතු, කැණීම් හෝ සකස් කිරීමේ කටයුතු සහ සියලු වැඩ සඳහා භාවිත කරන ලද, යන්ත්‍රෝපකරණ, පිරියත, ගොඩනැගිලි සහ භූමියෙන් ඉහළ හෝ පහළ පරිශ්‍ර ද ඇතුළු, ඛණිජ ද්‍රව්‍ය ගවේෂණය හෝ කැණීමේ කාර්යය සඳහා පොළොව විවෘත කිරීම හෝ ගවේෂණය කිරීම හෝ වැඩ කිරීම අදහස් වේ.".

**35.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.